# අයින්ස්ටයින්ගේ යුදෙව් ක්‍රිස්තියානිකම හා අපේකම

ග්‍රීක යුදෙව් ක්‍රිස්තියානි චින්තනයෙහි කාලය හා ආරම්භය පිළිබඳ ඇති මත ගැන අපි දැන් දනිමු. කාලය යනු ගලාගෙන යන්නක් බව සාමාන්‍යයෙන් මිනිසුන්ට ලැබෙන හැඟීම වුව ද බටහිර විද්‍යාවෙහි සමස්තයක් ලෙස ගත්කල කාලය සැලකෙන්නේ ගල්ගැසුණු දෙයක් ලෙස ය. කාලහීය යනුවෙන් බටහිර විද්‍යාඥයන් විසින් හැඳින්වෙන සංසිද්ධිය බටහිර භෞතික විද්‍යාවට තේරුම්කර දිය නො හැකි ය. අනෙක් අතට කාලයෙහි ආරම්භය ගැන  බටහිර විද්‍යාව මත දෙකක් ඉදිරිපත් කරයි. නිව්ටන් - කාන්ට් මතය ලෙස හැඳින්විය හැකි එක් මතයකින් කියැවෙන්නේ කාලය (හා අවකාශය, එමෙන් ම විශේෂ සාපේක්ෂතාවාදයෙහි අවකාශ - කාලය,) ප්‍රාග් අනුභූති බවත් කාලයට ආරම්භයක් නැති බවත් ය. මේ මතයට අනුව කාලය හා දෙවියන් වහන්සේ සදාකාලික ය. කාලය ආරම්භය වශයෙන් ගත්කල දෙවියන් වහන්සේ හා සම තත්ත්වයක් දරයි. කාලයේ ආරම්භය ගැන ඇති අනෙක් මතය 1915 න් පසු සාධාරණ සාපේක්ෂතාවාදය සමග ඇතිවූවක් වෙයි. ඒ මතයට අනුව කාලයට (අවකාශ - කාලයට) ද ආරම්භයක් ඇත. කාලය ආරම්භවන්නේ ලෝක (විශ්ව) නිර්මාණයත් සමග ය

මේ මත දෙකම ග්‍රීක යුදෙව් ක්‍රිස්තියානි චින්තනයෙන් ම බිහි වූ මත වෙයි. දෙවැනි මතය පළමුවැනි මතයටත් වඩා ග්‍රීක යුදෙව් ක්‍රිස්තියානි අදහස් තහවුරු කරයි. අප කලින් ද සඳහන්කර ඇති පරිදි දෙවැනි මතය සමග දෙවියන් වහන්සේ වඩාත් සුවිශේෂ වෙයි. ඒ මතයෙන් පසුව ආරම්භයක් නැත්තේ දෙවියන් වහන්සේට පමණකි. එපමණක් නොවෙයි. කාලය නිර්මාණයවීමට පෙර, එනම් ආරම්භවීමට පෙර, පෙර යන අදහසට අර්ථයක් නොමැති බැවින් විශ්වය (හා කාලය) නිර්මාණය වීමට පෙර කුමක් තිබුණේ ද වැනි ප්‍රශ්න අර්ථශූන්‍ය බව ඒ අනුව ප්‍රකාශකළ හැකි වෙයි. එමෙන් ම පරණ තෙස්තමේන්තු කතාව පිළිගන්නා අයට ලෝකය මැවීමට පෙර දෙවියන් වහන්සේ කුමක් කෙළේ ද වැනි ප්‍රශ්නවලට පිළිතුරු ලෙස ලෝකය මැවීමට පෙර කාලය ද නොතිබුණු හෙයින් ලෝකය මැවීමට පෙර යන්න අර්ථශූන්‍ය බව ප්‍රකාශකළ හැකි වෙයි.

අයින්ස්ටයින් පඬිවරයා ගැන නොයෙකුත් කතා කියනු අසන්නට කියවන්නට ලැබෙයි. ඇතැම් බෞද්ධයන් සිතන්නේ අයින්ස්ටයින් විද්වතා බෞද්ධයකු නොවුණේ නමට පමණක් බව ය. මේ මහා බුද්ධිමතා බුද්ධ ධර්මය ගැන කියා ඇතැයි කියන කරුණු ද බෞද්ධයෝ මහත් අභිමානයෙන් කියති. එමෙන් ම අයින්ස්ටයින් විද්වතා දෙවියන් වහන්සේ ප්‍රතික්ෂෙපකළ බව ද එතුමාට සිටියේ පෞද්ගලික දෙවි කෙනකු බව ද කියැවෙයි. එහෙත් අයින්ස්ටයින් පඬිවරයා විද්‍යාවේ දී කෙළේ කුමක් ද යන්න බොහෝ දෙනා නො දනිති. ඇත්තෙන් ම ඔවුන්ට ඒ ගැන දැනගැනීමට අවශ්‍යතාවක් ද නැත. අයින්ස්ටයින් පඬිවරයා බටහිර නූතනත්වයේ ඉතා තදින් ඇලී ගැලී සිටියේ ය. ඔහුගේ පෞද්ගලික දෙවියන් (Personal God) යන සංකල්පය ද ගලා එන්නේ  පහළොස්වැනි  සියවසේ ඇති වූ බටහිර නූතනත්වය හා සමග බැඳුණු පෞද්ගලිකත්වය සමග ය. පෞද්ගලික අයිතිය, පෞද්ගලික යාන වාහන, පෞද්ගලික සංගීතය රස විඳීම, පෞද්ගලික පොත පත, ආදී වශයෙන් සමාජය පෞද්ගලිකත්වය වැළඳ ගත්තේ පහළොස්වැනි සියවසෙන් පසුව ය. එදා සාමූහික ව සංගීතය රසවිඳි ජනයා අද බටහිර රටවල (ඇතැම්විට ලංකාවේ ද) කනේ රුවාගත් කුඩා කන්බනු (ear phones) ආධාර කරගනිමින් තනිව ම සංගීතය රසවිඳිනු දක්නට හැකි ය. පෞද්ගලික ව ප්‍රයෝජනයට ගතහැකි තැටි, සංයුක්ත තැටි ආදිය ද මේ පෞද්ගලිකත්වය පැතිර යෑමෙහි ප්‍රතිඵල වෙයි.

බුද්ධිමය වශයෙන් ගතහොත් මේ පෞද්ගලිකත්වයේ තර්කානුකූල අවසානයෙහි ඇත්තේ දෙවියන් වහන්සේ ද පෞද්ගලික කිරීම ය. ෂොපන්හෝවර් නම් බටහිර දාර්ශනිකයා එක්තරා ආකාරයකට මේ අදහස බටහිර සමාජයට හඳුන්වාදුන්නේ ය. අග්‍රගණ්‍ය බුද්ධිමතකු වූ අයින්ස්ටයින් පඬිවරයාට සාමූහික ව ඇදහූ දෙවියන් වහන්සේ කෙනකු වෙනුවට පෞද්ගලික දෙවියන් වහන්සේ කෙනකු සිටීම පුදුමයට කරුණක් නො වෙයි අයින්ස්ටයින් පඬිවරයා යනු වෙස්වළාගත් බෞද්ධයකු නොව බටහිර ග්‍රීක යුදෙව් ක්‍රිස්තියානි චින්තනය විසින් බිහිකරනු ලැබූ ඉහළ ම බුද්ධිමතා වෙයි. ඒ චින්තනයේ සාරය උකහාගත්තකු ලෙස ඔහු නිව්ටන් පඬිවරයාටත් ඉහළින් වැජඹෙන්නේ ය යන්න මගේ අදහස වෙයි.

© Prof. Nalin De Silva

අයින්ස්ටයින් පඬිවරයා විසින් දෙවියන් වහන්සේ ප්‍රතික්ෂේප නොකෙරුණා නොව දෙවියන් වහන්සේ පෞද්ගලිකකරනු ලැබිණි. අයින්ස්ටයින් පඬිවරයාට දෙවියන් වහන්සේ යනු පල්ලියට ගොස් සාමූහික ව අත් විඳින දෙවි කෙනකු නොව පෞද්ගලික සංයුක්ත තැටියක් මෙන් පෞද්ගලික ව සමීප විය හැකි දෙවි කෙනෙක් විය. එමෙන් ම අයින්ස්ටයින් විද්වතා තම සාධාරණ සාපේක්ෂතාවාදය හා විශ්වවේදය (Cosmology) මගින් ආරම්භය සම්බන්ධයෙන් දෙවියන් වහන්සේ හා සම තත්ත්වයක් ඉසිළූ කාලය (හා අවකාශය) එතැනින් ඉවත් කෙළේ කාලයට ද ආරම්භයක් ලබාදෙමින් ය. ඒ සමගින් ඔහු ලෝකය මැවීමට පෙර දෙවියන් වහන්සේ කුමක් කෙළේ ද වැනි අසහනකාරී ප්‍රශ්නවලින් දෙවියන් වහන්සේ නිදහස් කෙළේ ය. අයින්ස්ටයින් අග්‍රගණ්‍ය බුද්ධිමතකු බව සැබෑ ය. එහෙත් ඔහු අපේ නො වෙයි. ඔහු බුද්ධිමතකු වූයේ බටහිර ග්‍රීක යුදෙව් ක්‍රිස්තියානි චින්තනය පදනම්කරගනිමින් මිස සිංහල බෞද්ධ චින්තනයක නො වෙයි. ග්‍රීක යුදෙව් ක්‍රිස්තියානි චින්තනයෙන් යම් ප්‍රමාණයකට හෝ කැඩීමට උත්සාහකළ ක්වොන්ටම් භෞතිකය ප්‍රතික්ෂේප කිරීමට අයින්ස්ටයින් විද්වතාට හැකිවූයේ ඔහු ඒ චින්තනයෙහි ඇලී ගැලී ජීවත් වූ එහි ප්‍රධාන ප්‍රකාශකයා වීම නිසා ය. මෙරට ඕල්කට් බෞද්ධයන්ට අයින්ස්ටයින් විද්වතා බෞද්ධකිරීමට අවශ්‍ය වී ඇත්තේ ඔවුන් ඕල්කට් බෞද්ධයන් වීම නිසා මිස අන් කරුණක් නිසා නො වෙයි.

කාලය ගැන සිංහල බෞද්ධයන්ට කිවහැක්කේ කුමක් ද? පළමුවෙන් ම කිවයුත්තේ සිංහල ථෙරවාදී බෞද්ධයන්ට අනුව කාලය යනු පඤ්ඤත්තියක් පමණක් බව ය. ධම්මසංගණියට බුද්ධඝෝෂ හිමිපාණණ් වහන්සේ විසින් ලියන ලද අත්ථසාලිනි නම් අටුවාවෙහි කාලය යනු පඤ්ඤත්තියක් යැයි දක්වා තිබේ. ථෙරවාදී සම්ප්‍රදාය තරම් කාලය පිළිබඳ ව අධ්‍යයනය කළ වෙනත් සම්ප්‍රදායක් ලෝකයේ තිබිණි යැයි සිතිය නොහැකි ය. ඇමරිකානු මායා ශිෂ්ටාචාරයෙහි මෙන් ම බැබිලෝනියානු ආදී සම්ප්‍රදායන්හි ද කාලය අධ්‍යයනයට ලක්කෙරී ඇති මුත් ඒ බොහෝ විට ප්‍රායෝගික ව ය. ඔවුන් වඩාත් උනන්දුවක් දැක්වූයේ කාලය මැනීම කෙරෙහි ය. බැබිලෝනියානුන් මෙන් ම පැරණි ඇමරිකානුවෝ ද (කොලම්බස් ඇමරිකාවට යෑමට පෙර එහි සිටි ඇමරිකානුවෝ) දින දර්ශන සැකසීමට මහත් වෙහෙසක් ගත්තෝ ය. එහෙත් කාලය යනු කුමක් ද යන්න අධ්‍යයනයට ලක්කළ ප්‍රධාන ම පිරිස ථෙරවාදීන් යැයි මම සිතමි.

කාලය යන්න පුටුව වැන්නක් නො වෙයි. අපට පුටුව දැකබලාගත හැකි වෙයි. අපට එය ස්පර්ශකළ හැකි ය. කෙටියෙන් කියන්නේ නම් පුටුව යනු ඉන්ද්‍රිය ගෝචර වස්තුවක් වෙයි. පුටුව ඉන්ද්‍රිය ගෝචර වස්තුවක් වේය යන්නෙන් කියැවෙන්නේ මනස හැරෙන්නට අනෙක් ඉන්ද්‍රියවලට ද පුටුව ගෝචරවන බවත් ඒ ඉන්ද්‍රිය නොමැතිව පුටුව යනුවෙන් වස්තුවක් අපට නොපවතින බවත් ය. එහෙත් පුටුව යනු අනෙක් ඉන්ද්‍රියවලට පමණක් ගෝචර වූවක් නො වෙයි. පුටුව අනෙක් ඉන්ද්‍රියවලට ගෝචර වේය යන්නෙහි තේරුම ම එය මනසට ද ගෝචරවන බව ය. පුටුවට හෝ වෙනත් වස්තුවකට හෝ මනසට ගෝචර නොවී වෙනත් ඉන්ද්‍රියකට ගෝචර විය හැකි නො වෙයි. චක්ඛු විඤ්ඤාණය ඇතිවන්නේ හුදෙක් ඇසින් පමණක් නො වෙයි. එයට මනස ද අවශ්‍ය වෙයි. මෙයින් කියැවෙන්නේ පුටුව යන්න මනස මෙන් ම අනෙක් ඉන්ද්‍රිය නිසා ද ඇතිවන්නක් බව ය.

එහෙත් කාලය යන්න ඇසෙන් හෝ කණෙන් හෝ දැකගන්නක් හෝ අසාගන්නක් හෝ නො වෙයි. කාලය අපේ මනසට දැනෙයි. අපට එය ඇසිය නො හැකි ය. දැකිය නො හැකි ය. ස්පර්ශකළ නො හැකි ය. එහි රස බැලිය නො හැකි ය. එහි ගඳ සුවඳ දැනගත නො හැකි ය. එහෙත් එය මනසට පමණක් දැනෙයි. කාලය යනු මනසේ නිර්මාණය වූවකි. එය පුටුව වැනි සංකල්පයක් නො වෙයි. පුටුව යන සංකල්පය ද මනසේ නිර්මාණයක් වුවත් එය මනසේ නිර්මාණය වන්නේ අනෙක් ඉන්ද්‍රියන්ගේ ද ඍජු ආධාරය ඇතිව ය. එහෙත් කාලය එසේ නො වෙයි. එය විශේෂිත වූ සංකල්පයකි. කාලය නම් සංකල්පය නිර්මණය කිරීමට මනසට වෙනත් ඉන්ද්‍රියක් ඍජුව අවශ්‍ය නො වෙයි. කාලය යනු විශේෂිත සංකල්පයක්, පඤ්ඤත්තියක් වන්නේ එබැවින් යැයි අපි කියමු. පඤ්ඤත්තියක් යනු වෙනත් ඉන්ද්‍රියක ඍජු ආධාරයක් නොමැති ව මනස විසින් නිර්මාණය කෙරෙන සංකල්පයක් යැයි අපි අර්ථදක්වමු. එවිට පඤ්ඤත්තියක් යන්න ද සංකල්පයක් වෙයි. එහෙත් එය විශේෂිත වූ සංකල්පයකි. කාලය යනු එවැනි පඤ්ඤත්තියකි.

පඤ්ඤත්තියක් ගැන එවැනි අර්ථකථනයක් තිබෙන්නේ කිනම් සූත්‍රයක ද, කිනම් අටුවාවෙහි ද, කිනම් ටීකාවෙහි ද යනුවෙන් ප්‍රශ්න රාශියක් ඇසීමට බලා සිටින්නෝ වෙති. අපි මේ අයට එකක් කියමු. සිංහල බෞද්ධ දැනුම යනු සූත්‍රවලට, අටුවාවට හා ටීකාවලට සීමා වූ දැනුමක් නො වෙයි. එය එසේ සීමාකිරීමට තැත්කිරීම ද වරදකි. අපි ඕල්කට් බෞද්ධයන්ගෙන් හා ඇතැම්විට ඔවුන් අනුව යන සාම්ප්‍රදායික බෞද්ධ උගතුන්ගෙන් වෙනස්වෙමු. අපි දැනුම

© Prof. Nalin De Silva

නිර්මාණය කරන්නෙමු. එසේ නිර්මාණය කරන දැනුම අටුවාවේ හෝ ටීකාවේ හෝ තිබීමට කිසිම හැකියාවක් නොමැත. අටුවාවේ හෝ ටීකාවේ හෝ සූත්‍රවල තිබෙන දැනුම නැවත නැවත ගෙනහැර දැක්වීම දැනුම නිර්මාණය කිරීමක් නො වෙයි. අපට අවශ්‍ය අපේ සම්ප්‍රදායේ අපේ චින්තනය මත පදනම් ව අපේ ප්‍රවාද නිර්මාණයකිරීමට මිස පැරණි ප්‍රවාද නැවත ගෙනහැර දැක්වීම නො වෙයි. මෙයින් අදහස් කරන්නේ අප පැරණි දැනුම නැවත ගෙනහැර නොදක්වන බව නො වෙයි. අවශ්‍ය වූ විට අපි එය ද කරන්නෙමු. එහෙත් අපි එයට පමණක් සීමා නො වෙමු.

අටුවාවේ හා ටීකාවේ ඇති දැනුම ද බුදුන් වහන්සේ දේශනා කළ දහම නො වෙයි. එහි ඇත්තේ එකල විසූ බුද්ධිමතුන් සිංහල ථෙරවාදී බෞද්ධ සම්ප්‍රදායෙහි සිටිමින් නිර්මාණයකළ දැනුම වෙයි. බටහිර යටත්විජිතවාදී සමයෙන් පසු අපේ උගත්තු නිර්මාණකරණයෙන් ඈත්වූහ. ඔවුන්ගේ ශාස්ත්‍රීය ලිපි පත පොත ආදිය තිබෙන දැනුම ම වෙනත් ආකාරවලින් ඉදිපත්කිරීම සඳහා පමණක් වෙන්විය. යමකු අභිධර්මයෙහි සඳහන් චිත්ත චෛතසික විභාගය පිළිබඳ අධ්‍යයනයක් කරනවා විය හැකි ය. එහි වරදක් නැත. එහෙත් එයින් කෙරෙන්නේ අභිධර්මයෙහි ඇති දැනුමෙන් කොටසක් වෙනත් ආකාරයකට ඉදිරිපත්කිරීම ය. එහි වරදක් නැති නමුත් එය ප්‍රමාණවත් නැත. උගතුන්  කොටසක් එලෙස පැරණි දැනුම වෙනත් ආකාරවලින් ඉදිරිපත් කරත් දී තවත් පිරිසක් වෙනත් නෙයියාඩමක් නටති. මේ නෙයියාඩම්කරුවන්ට අවශ්‍ය වී ඇත්තේ බටහිර විද්‍යාවට වඩා බුදු දහමෙහි දක්වා ඇති දැනුම වර්ධනය වී ඇති බව පෙන්වීම ය. කලින් කී පිරිස පැරණි දැනුම වෙනත් ආකාරයකට ඉදිරිපත්කිරීමෙන් වරදක් නො කරති. එහෙත් දෙවැනි පිරිස භයානක වරදක් කරති. ඔවුහු ජනමාධ්‍ය උගත්තු වෙති. ඔවුන්ට ටෙලි උගතුන් යැයි කීමේ ද එතරම් වරදක් නැත. මේ නෙයියාඩම්කරුවන් කළ යුත්තේ බටහිර විද්‍යාවේ දැනට ඇති දැනුම අවුරුදු දෙදහස් හයසියයකට පෙර බුදුන් වහන්සේ දේශනා කර ඇතැයි කීම නොව තවමත් බටහිර විද්‍යාව විසින් කිසිවක් නොකෙරී ඇති ක්ෂෙත්‍රවල බුදුන් වහන්සේ දේශනා කර ඇතැයි කියන දැනුම් වහාම අපට ද බටහිර ලෝකයට ද කියා දීම ය. බටහිර විද්‍යාව යමක් කියනකම් බලා නොසිට කල්තබා ම අනාවැකි පළකිරීමට මේ නෙයියාඩම්කරුවන්ට හැකිවිය යුතු ය.

**මහාචාර්ය නලින් ද සිල්වා**

© Prof. Nalin De Silva